ජාතික අයවැය චක්‍රලේඛ අංක:4/2015

NBD/AO/1/1/2015/04
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2015 ඔක්තෝබර් 02

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සමාගම්, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්.

**රාජ්‍ය වියදම් කළමනාකරණය - දින දර්ශන සහ දිනපොත් මුද්‍රණය**

මහජනතාවට, සේවකයින්ට සහ සේවය ලබාගන්නා වෙනත් පාර්ශවයන් වෙත නොමිළයේ බෙදා හැරීමට මුද්‍රණය කරනු ලබන දින දර්ශන සහ දින පොත් සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජයට අයත් සමාගම් ද ඇතුළුව ව්‍යවස්ථාපිත ආයතන වාර්ෂිකව රජයේ මුදල් විශාල ප්‍රමාණයක් වැය කරන බව නිරීක්ෂණය වී ඇත. මෙම අයිතමයන් මුද්‍රණය කිරීමෙන් රාජ්‍ය වියදම සඳහා ඇති කර තිබෙන බලපෑම ද සැළකිල්ලට ගෙන, ඒකාබද්ධ අරමුදල් භාවිතා කරමින් දින දර්ශන හා දින පොත් මුද්‍රණය කිරීම 2016 වර්ෂයේ සිට නතර කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

02. එහෙත්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් රජයේ ආයතනවල ප්‍රයෝජනය සඳහා මුද්‍රණය කරනු ලබන දින දර්ශන සහ දින පොත් මුද්‍රණය කිරීමේ වාර්ෂික වැඩසටහන් සඳහා මෙම උපදෙස් අදාළ කරගත යුතු නැත.

ආර්.එච්.එස්.සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති